

# ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව

COMITE INTERNATIONAL GENEVE

ICRC

# අප ඉටුකරන සේවාවන්

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) 1989 සිට ශ්‍රී ලංකාවේ සිය සේවාවන් ඉටු කරයි. එම කාලයේදී අපි ජනතා විමුක්ති පෙරමුණේ නැගිටීම සහ ශ්‍රී ලංකා රජය සහ ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානය අතර පැවති ගැටුම නිසා පීඩාවට පත් ජනතාවගේ අවශ්‍යතා වලට ප්‍රතිචාර දැක්වීමු. මේ දිනවල අපි ඉතිරිව පවතින මානුෂවාදී අවශ්‍යතා ආමන්ත්‍රණය කරමින් සිටිමු.

අතුරුදහන්වූවන්ගේ පවුල්වලට ඔවුන්ගේ අතුරුදහන් වූ ඥාතීන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි යන ප්‍රශ්නයට පිළිතුරක් ලබාදීමට හැකිවන පුළුල් ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් අපි කතා කරමු. මෙම පවුල්වලට සිය මනෝසමාජීය, නෛතික, පරිපාලන සහ ආර්ථික, අවශ්‍යතා ඉටුකර ගැනීමට උපකාරයක් වශයෙන් අපි රටපුරා සහායක වැඩසටහනක් ක්‍රියාත්මක කරමු.

රැඳවියන්ට සැලකීමේ සහ සෞඛ්‍ය සේවා ලබාගැනීමට ඇති හැකියාව සහ ඔවුන්ට ඇති විනිශ්චයක ඇසපවීම් සඳහා ගරුකිරීම ඇතුලු සියලුම රැඳවියන් රඳවාගැනීමේ තත්වයන් දියුණු කිරීමට බලධාරීන්ට ආධාර කිරීම පිණිස අපි ශ්‍රී ලංකාවේ පුද්ගලයන් රඳවාගෙන සිටින ස්ථානවල සංචාරවල යෙදෙමු.

සන්නද්ධ ගැටුම්, ස්වාභාවික විපත් හෝ සංක්‍රමණයේදී මියයන පුද්ගලයන්ගේ මළසිරුරු වෘත්තීයමය තත්වයකින් සහ ගරුබුහුමන් දක්වමින් කළමනාකරණය කළ යුතුය. වෛද්‍ය ප්‍රජාවට ඔවුන්ගේ අධිකරණ වෛද්‍ය කුසලතා ප්‍රගුණ කරගැනීමට උපකාර කරන අපි අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රතිපත්ති සාකච්ඡාවලට දායකවෙමු.

අපි සන්නද්ධ හමුදා සාමාජිකයන්, බලධාරීන්, සිවිල් සමාජය සහ විද්වතුන්, අතර ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කරන අතර සෝදිසි කිරීම්, අත්අඩංගුවට හා රඳවාගැනීමේ පටිපාටිවලට අදාලවන ජාත්‍යන්තර නීති ප්‍රමිති සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් පුහුණු කරමු.

අපි අපගේ ජාතික හවුල්කරු වන ශ්‍රී ලංකා රතු කුරුස සමාජය සමග එක්ව ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ සමාජ සම්මේලනයේ කාර්යයන්හි කේන්ද්‍රීය වන විශ්ව මානුෂවාදී ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කරමු.



ICRC

# අතුරුදහන්වූවන්ගේ පවුල්වල අවශ්‍යතා කෙරෙහි ප්‍රතිචාර දැක්වීම

කලින් ගැටුම පැවති කාලයේදී ඥාතීන් අතුරුදහන්වූ පවුල්වලින් එම පුද්ගලයන් සොයා ගැනීම සඳහා ඉදිරිපත් කෙරුණු ඉල්ලීම් 34,000 කට වැඩි සංඛ්‍යාවක් අප ලියාපදිංචි කොට ඇත. මේවන විට රටපුරා අතුරුදහන්වී සිටින පුද්ගලයන් සොයාදෙන ලෙස පුද්ගලයන් අතුරුදහන්වූ පවුල් වලින් ලැබුණු ඉල්ලීම් 16,000 ක් අපලඟ ඇත. ඉන් සමහරක් 1990 දී පමණ ලැබුණු ඉල්ලීම්ය. එක් එක් සිද්ධි යාවත්කාලීන කිරීම පිණිස යළිත් මෙම පවුල් සම්බන්ධකරගනිමින් සිටිමු.

අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල් 395 සම්බන්ධ කරගනිමින් අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතා හොඳින් හඳුනාගැනීම පිණිස 2014-2015 වසරවලදී අපි තක්සේරුවක් කළෙමු. අනතුරුව මෙම තක්සේරුවෙන් සොයාගත් සවිස්තරාත්මක කරුණු සහ නිර්දේශ බලධාරීන්ට ඉදිරිපත් කළෙමු. පැවැත්වූ සම්මුඛ සාකච්ඡා අනුව, මෙම පවුල්වලින් බහුතරයකගේ මහත් අභිලාෂයවී ඇත්තේ තමන්ගේ අතුරුදහන්වූ ඥාතියාට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීම සහ මානසික සහන ලැබීමයි. ඔවුන්ට යළිත් ස්වකීය ජීවනෝපායන් ආරම්භ කිරීමටත් පරිපාලන සහ නෛතික බාධක විසදා ගැනීමටත් අවශ්‍ය ඇත. අප මෙම අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට සහායක වැඩසටහනක් ඇරඹූ අතර එය දේශීය සංවිධාන සමග හවුල්වී ක්‍රියාත්මක කරයි. අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල් නිතරම "සැකමුසු නැතිවීම" අත්විඳිමින් කල්ගතකරන අතර අවසන්වීමක් හෝ වැටහීමක් නොමැති නිසා එය අනිශ්චිත ශෝකයකි. එය මනෝසමාජීය සහ උපදේශන විෂයමාලාවට එක්කිරීමේ අරමුණින් අපි මෙම සංකල්පය ගැනදැනුම වර්ධනය කිරීම පිණිස විශ්ව විද්‍යාලවල දී දේශන පවත්වමු. පිළිතුරු අපේක්ෂාවෙන් පසුවන අතරතුර ඔවුන්ට සිය කටයුතු කරගෙනයාමට පවුල්වලට මානසික ආධාර ලැබීමට නම් උපකාර කළ හැකි "සැකමුසු නැතිවීම" අවබෝධ කරගැනීම අත්‍යවශ්‍යය.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අතුරුදහන් වූ පුද්ගලයන් වෙනුවෙන් මරණ සහතිකයට විකල්පයක් ලෙස දක්නට නොමැති සහතික නිකුත්කිරීම හඳුන්වාදීමට ශ්‍රී ලංකාවේ බලධාරීන් සමග කටයුතු කළේය. ආයාචනයක් ලැබුනු අවස්ථාවලදී අපි අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට ඇති නීති සහ මිනිස් මළසිරුරු කොටස් හඳුනාගැනීමේ විද්‍යාත්මක ක්‍රියාවලිය පිළිබඳව විශේෂඥ උපදෙස් සපයමු.



T.Zaharan/ICRC

# රැඳවියන්ට සැලකීම සහ රැඳවුම් ස්ථානවල තත්වය දියුණු කිරීමට බලධාරීන්ට ආධාර කිරීම

1989 සිට අපි ශ්‍රී ලංකාවේ රැඳවියන් හමුවීමේ සංචාරවල යෙදී සිටිමු. එම කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ නැගිටීම සහ ඉන් පසුව පැවති සන්නද්ධ ගැටුම සම්බන්ධයෙන් රඳවාගෙන සිටින රැඳවියන් හමුවීමට සංචාරවල යෙදුනෙමු. වර්තමානයේ අපි රැඳවුම් මධ්‍යස්ථාන වලදී සියලුම රැඳවියන් මුණගැසීමට යන්නෙමු. එම අවස්ථාවලදී සොයාගන්නා යම් කරුණු ඇත්නම් ඒවා සහ නිර්දේශ රැඳවියන්ට සැලකීම සහ ඔවුන්ගේ ජීවන තත්වය හා අධිකරණ ඇපවීම වෙනුවෙන් රැඳවියන්ට ඇති අයිතියට ගරු කිරීම දියුණු කිරීම අරමුණු කොට ගෙන රැඳවුම් බලධාරීන් සමඟ පමණක් බෙදාගැනේ. බන්ධනාගාර ඇතුලත කුඩාපරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අපි බන්ධනාගාරවල තදබදය පිලිබඳ ප්‍රශ්නය ආමන්ත්‍රණය කිරීමට සහ රැඳවියන් සඳහාවන බන්ධනාගාර සෞඛ්‍ය ආරක්ෂණ සේවය දියුණු කිරීමට අදාල බලධාරීන් සමග වැඩකරමු.

බන්ධනාගාර නිලධාරීන්ගේ තාක්ෂණ ධාරිතාව ගොඩනැගීමේ සහ ප්‍රශස්ත භාවිතයන් හුවමාරු කරගැනීමට පහසුකම් සැපයීමේ අරමුණින් අපි ඔවුන් උදෙසා දේශීය වැඩමුළු සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සංවිධානය කරන අතර මේවාට සහභාගිවීමට ඔවුන්ට අනුග්‍රහය දක්වමු. බන්ධනාගාරවල තදබදයට අදාල නෛතික සහ අධිකරණ ගැටලු ආමන්ත්‍රණය කිරීම පිණිස ජාතික කාර්යසාධක බලකායක් පිහිටුවීමට අපි දායකවීමු. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ අධිකරණ අමාත්‍යාංශවල ලේකම්වරුන් සම සභාපතිත්වය දැරූ එම ජාතික කාර්යසාධක බලකාය 2016 දී කැබිනට් මණ්ඩලය විසින් පිළිගන්නා ලදී. බන්ධනාගාරවල තදබදයට අමතරව බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නිරාකරණය කිරීමට එහි වරය පුළුල් කරන ලදී.

රැඳවුම්භාරයේ පසුවන පුද්ගලයන්ට ප්‍රියාදරයන් සමඟ සම්බන්ධවී සිටීමට රතු කුරුස පණිවුඩ මාරු කරගැනීමට සහ රැඳවියන් හමුවීමට යාමට පවුල්වලට අපි ගමන් වියදමක් සපයමු. හදිසි අවස්ථාවන්හීදී එයට ගැලපෙන ලෙස ආධාර කරන අපි රැඳවියන්ට විනෝදය සහ අධ්‍යාපනය පිණිස අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ ලබාදෙමු.



F.Dufour/ICRC

# අධිකරණ වෛද්‍ය ධාරිතාව ශක්තිමත් කිරීම

ලොව පුරා, සන්නද්ධ ගැටුම්වලදී සහ වෙනත් ආපදාවලදී හෝ සංක්‍රමණවලදී මියයන තැනැත්තන්ගේ මළසිරුරු ගෞරවාන්විතව සහ වෘත්තීය තත්වයෙන් මෙහෙයවීම සහතික කිරීමට අපි ක්‍රියාකරමු. ශ්‍රී ලංකාවේදී අපි මිනිස් මළසිරුරු සොයා ගැනීමට, විශ්ලේෂණය කිරීමට සහ හඳුනාගැනීමට අධිකරණ වෛද්‍ය පුරාවිද්‍යාව සහ මානව විද්‍යාව යොදා ගැනීම සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය කාර්ය මණ්ඩලය පුහුණු කරමු. එමෙන්ම ඔවුන්ට විදේශයන්හිදී අධිකරණ වෛද්‍ය විද්‍යා පුහුණුව පිණිස අනුග්‍රහය ලබාදෙමු.

ආපදාවලදී මළසිරුරු කළමනාකරණයෙහි අභියෝග ආමන්ත්‍රණය කිරීමට සම්මන්ත්‍රණ පැවැත්වීමට අපි අනුග්‍රහය දක්වමු. අධිකරණ වෛද්‍ය සහ ධූලකවේද ආයතනය සමග අප අරඹා ඇති තත්ව සහතික නියමු ව්‍යාපෘතියක කොටසක් ලෙස, පවතින පහසුකම් දියුණු කිරීමට, ධාරිතා ගොඩනැගීමට සහ අධිකරණ වෛද්‍ය දත්ත රැස්කිරීම, මධ්‍යගත කිරීම හා කළමනාකරණය පිණිස අපි තාක්ෂණික විශේෂඥ සේවා ලබාදෙමු.



R.De Abreu/ICRC



J.Atkinson/ICRC

## ශ්‍රී ලංකා රතු කුරුස සමාජය සමග සහයෝගයෙන් වැඩකිරීම

අතීතයේ පැවති ගැටුම නිසා හෝ ස්වාභාවික ආපදා නිසා වෙන්වී සිටින පවුල් සාමාජිකයන් අතර යළි සම්බන්ධතා ඇතිකිරීම පිණිස ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට මූල්‍ය, තාක්ෂණ සහ ද්‍රව්‍ය ආධාර ලබාදෙමින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව එම සමාජය සමග සහයෝගයෙන් වැඩකරයි. මෙම සංවිධානයේ මූලික ප්‍රතිපත්ති සහ මානුෂවාදී අගයන් ප්‍රවර්ධනයේදී සහ එහි කාර්ය මණ්ඩලයේ සහ ස්වේච්ඡා සේවකයන්ගේ හදිසි අවස්ථා ප්‍රතිචාර ධාරිතාව සහ ප්‍රථමාධාර කුසලතා සංවර්ධනයේදී අපි ජාතික සමාජය සමග සහයෝගයෙන් වැඩකරමු. එම පිරිසට සුරක්ෂිත ප්‍රවේශය ගැන ලබාදෙන පුහුණුවට අන්තරාදායක පරිසරයන්හී ඔවුන්ගේ සුරක්ෂිතතාව ඉහලනංවා ගැනීමේ ක්‍රියාමාර්ග ඇතුලත්ය.


L.Gillett/ICRC

# මානුෂවාදී ප්‍රතිපත්ති ගරුකොට සැලකීම ප්‍රවර්ධනය කිරීම

සන්නද්ධ ගැටුම්වලදී සහ වෙනත් ප්‍රචණ්ඩ ක්‍රියාවලදී හටගන්නා දුක්පීඩා සහ උපද්‍රව පිටුදැකීමට අප දරන ජාත්‍යන්තර උත්සාහයේ කොටසක් ලෙස අපි සන්නද්ධ හමුදා, ජාතික බලධාරීන්, සිවිල් සමාජය සහ විද්වතුන් අතර ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කිරීමට සහ ඒ පිළිබඳ ඔවුන්ගේ දැනුම ප්‍රගුණ කිරීමට ක්‍රියාකරමු. ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ මූලධර්ම ඔවුන්ගේ පුහුණු පාඨමාලාවලට සහ විෂයමාලාවට අන්තර්ගත කිරීමට උදව් කරන අපි මෙම විෂය ගැන ඔවුන්ගේ සාමාජිකයන් තුළ ඇති දැනුම වර්ධනය කරගැනීම පිණිස ඔවුන්ට එතෙර සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සමුළුවලට සහභාගිවීමට අරමුදල් ලබාදෙමු. එක්සත්ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම්වලට ශ්‍රී ලංකාව හටපිරිස් ලබාදෙන නිසා එතෙර රටවල එම මෙහෙයුම්වලට යන සන්නද්ධ හමුදා සාමාජිකයන්ට සහ සාගර ආරක්ෂක මෙහෙයුම්වල යෙදෙන නාවික හමුදාවට මානුෂවාදී නීතිය පිළිබඳ පුහුණු සැසි සංවිධානය කරමු. අපි ශ්‍රී ලංකා පොලීසියේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ සහ මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ නිලධරයන්ට නිවැරදි ලෙස බලය සහ ගිනිඅවි භාවිතය සහ සෝදිසි කිරීම්, අත්අඩංගුවට ගැනීම් සහ රැඳවාගැනීමේ පටිපාටිවලදී ජාත්‍යන්තර ප්‍රමිති භාවිතය ආවරණය වන පරිදි ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය ගැන පුහුණුව ලබාදෙමු.

ජාත්‍යන්තර අපරාධ අධිකරණ පද්ධතියකදී ජාත්‍යන්තර මානුෂවාදී නීතිය කෙසේ භාවිත කෙරෙන්නේදැයි අවබෝධයක් ලබාදීම පිණිස නීති උපාධි අපේක්ෂකයන් සඳහා අපි වාර්ෂික වාද උසාවි තරඟයක් සංවිධානය කරමු.

ලොවපුරා සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් පීඩාවට පත් ජනතාවට උපකාර කරන අපි, ඔවුන්ට හිමි ගරුත්වය රැකගැනීමට සහ දුක්වේදනාවන් ගෙන් සහනය ලබාගැනීමට නිතරම අපගේ රතු කුරුස සහ රතු අඩසඳ හවුල්කරුවන් සමග එක්වී අපට කළ හැකි සෑම දෙයක්ම කරමු. මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කරමින් හා ශක්තිමත් කරමින් සහ විශ්ව මානුෂවාදී ප්‍රතිපත්ති මුදුන්පත් කරමින් දුෂ්කරතා පිටුදැකීමටද අපි උත්සාහ කරමු.


facebook.com/icrc
twitter.com/icrc
instagram.com/icrc

**ජාත්‍යන්තර රතු කුරුස කමිටුව**
29, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5
ශ්‍රී ලංකාව
දුරකථන +94 (11) 250 33 46  ෆැක්ස් +94 (11) 250 33 48
E-mail : colombo@icrc.org

**වව්නියාව කාර්යාලය**
70, වයිරවර් කෝවිල පාර
වයිරවර්පුලියන්කුලම්
වව්නියාව
දුරකථන +94 (0) 24 222 28 55   ෆැක්ස් +94 (0) 24 222 28 37

**මඩකලපුව කාර්යාලය**
මන්රීසා පාර
කොතුකුලම්, පිලයාරඩි
මඩකලපුව
දුරකථන +94 (0) 65 222 70 70


ICRC


0117/259 11.2017 500 පිටකවර ඡායාරූපය: Tuan Zaharan